**ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 12,588.85 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 11,821.17 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 767.68 ක් හෙවත් සියයට 6.10 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 9,465.50 | 9,403.84 | 61.66 | 0.65 |
| මූලධන | 3,123.35 | 2,417.33 | 706.02 | 22.60 |
| **එකතුව** | **12,588.85** | **11,821.17** | **767.68** | **6.10** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය සඳහා 20-02-01-04 දරන ආදායම් සංකේතය සඳහා එකතුව රු.මිලියන 1,000.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 645.46 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 64.55 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20-02-01-04 | 1,000 | 645.46 | 355.54 | 35.45 |

**2.3 අත්තිකාරම් ගිණුම**

**2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 13501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 15.00 | 20.55 | 0.60 | 19.37 | 50.00 | 25.01 |

අමාත්‍යාංශ 03 ක් ඒකාබද්ධවීමේදී ණය ශේෂ පවරා ගැනීම වැරදීමකින් 8493/0/0/135011 යටතේ රු.8,563,593 ක් වර්ෂයේ හර කිරීම් හා බැර කිරීම් යටතේ සටහන් කිරීම නිසා තථ්‍ය වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා ඇත. එම වරද නිවැරදි කිරීමට තථ්‍ය වියදම ගැලැපූ පසු සීමාව ඉක්මවීමක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

**2.4 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0331/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.1 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 2.23 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0015/0047/000 | 0.27 |
| 6000/0000/00/0019/0016/000 | 0.90 |
| 6000/0000/00/0015/0200/000 | 0.02 |
| 6000/0000/00/0018/0067/000 | 0.89 |
| 6000/0000/00/0002/0108/000 | 0.15 |
| එකතුව | **2.23** |

## 2.6 විගණන නිරීක්ෂණය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ආ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | නිවාඩු පිළිබඳ ලේඛනය | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.2 අග්‍රිම ගිණුම්

--------------

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 11 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.112,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාස 01 ක සිට මාස 03 ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර අග්‍රිම නිරවුල් කර තිබුණි.

## 3.3 ආදායම් ගිණුම්

----------------

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 20.02.01.04 දරන ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාළව රු.මිලියන 1,000.00 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 645 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 65 ක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.439,756,841 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01ක සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එයින් රු.148,969,546 ක් හෙවත් මුළු හිඟහිටි ආදායමෙන් සියයට 33.8 ක් අයකර ගැනීමට ඇස්තමේන්තුකර තිබුණත්, ඉන් රු. 126,114,550 ක ආදායම් රැස්කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායම වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු.මිලියන 88 ක් දක්වා අඩුවී තිබුණි.

(ඈ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා රජයට අයත් ව්‍යාපාර ඒකක රාජ්‍ය සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් පිහිටුවා තිබුණි. ඒ අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට අයත් වතු 571 ක් අවුරුදු 53 ක කාලයක් සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට කල්බදු පදනම මත පවරා දී තිබුණි. බදු කුලිය ගණනය කිරීම සඳහා භාවිත කරන ලද සූත්‍රය අනුව සමාගම්වල ශුද්ධ වත්කම් ප්‍රමාණය රු.මිලියන 200 ට අඩුවීම නිසා අගරපතාන, උඩුපුස්සැල්ලාව සහ ඇල්කඩුව යන සමාගම් 3 ට අයත් වතු 45 ක් වෙනුවෙන් 1992 වර්ෂයේ සිට බදු කුලී අයකරගෙන නොතිබුණි. “ බදු කුලී සංශෝධනයක් කළ හැකි වන්නේ බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි සංශෝධනය කිරීමකින් පසුව වන අතර බදු ගිවිසුම්වල එවැනි සංශෝධනයක් කළ හැකි වන්නේ අදාල සමාගමේද එකඟතාවය ඇතිව බව” ඊට හේතු වශයෙන් අමාත්‍යාංශය සඳහන් කර තිබුණි. සමස්ථ වශයෙන් සියළුම වැවිලි සමාගම් සමඟ අත්සන් කර තිබුණු බදු ගිවිසුම්වල සඳහන් කොන්දේසිවල සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳව අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර ඇති බවද”. අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා තිබුණි. එම සමාගම්වලින් බදුකුලී අයකර ගැනීමේ හැකියාව පිළිබඳ නැවත සලකා බැලීමක් සිදුකර නොතිබීම නිසා රජයට අයකර ගත හැකිව තිබුණු බදුකුලී ආදායම් අහිමිවී තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, වැවිලි සමාගම්වලට අයත් හෙක්ටර්යාර 249,892 ක් වූ වතු 535 ක් තිබුණි. පවරන ලද ඉඩම්වල නිවැරදි භූමි ප්‍රමාණයන් හඳුනා ගැනීමට සීමා මායිම් නිර්ණයට අදාළ සාක්ෂි කිසිවක් නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට කාර්මික ජනපද, ජල පහසුකම් සැපයීම් හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය වැනි පොදු කටයුතු සඳහා නිවාස ව්‍යාපෘති 22 ක්, පාසැල් 10 ක්, වතු රෝහල් 7

ක්, ආගමික ස්ථාන 45 ක්, සුසාන භූමි 25 ක්, ක්‍රීඩා පිටි හා අනෙකුත් සුභසාධක කටයුතු වෙනුවෙන් ඉඩම් ලබාදී තිබුණි. ඒ සඳහා ලබාදී තිබූ හෙක්ටයාර් ප්‍රමාණය පිළිබඳ නිශ්චිත තොරතුරු වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය සතුව ක්‍රමවත්ව නොමැති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර රජයේ ඉඩම්වල නිවැරදි අයිතිය තහවුරු කර නොතිබුණි. 2006 ඔක්තෝබර් 13 දිනැති රජයේ ඉඩම් බදුදීම නමින් වූ අමාත්‍ය මණ්ඩල වැඩසටහන අනුව 2006 වර්ෂයේ සිට වසර 03 ක් ඇතුළත සියළු ඉඩම් මැනීමට කටයුතු කළ යුතු යැයි නිර්දේශ කර, වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සළසා තිබුණද, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හිඟය හා මැනුම් සඳහා ගෙවීම්වලට අදාළව පැවති ගැටළු හේතුවෙන් එම කටයුතු අවසන් කිරීමට නොහැකි වූ බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ඊ) 2015 වර්ෂය අවසන් වන විට සමාගම් 23 ක් මගින් පාලනය වන වතුවල අනවසර පදිංචි හා බලහත්කාර පදිංචි පුද්ගලයින් 565 කට අදාළ අනවසර ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් අධිකරණයේ නඩු 117 ක් විභාග වෙමින් පවතින අතර, වැවිලි සමාගම් වෙත අදාළ වතු බදුදීමේදී ඒ හා සමගම ඇටෝර්නි බලපත්‍රයක් බදු කරු (ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව /ජනතා වතු සංවර්ධන මණ්ඩලය) විසින් බදු ගැනුම්කාර වතු සමාගම් වෙත ලබාදී තිබුණි. එම ඇටෝර්නි බලපත්‍රයේ විධිවිධාන අනුව බදු දීමනාකාර පාර්ශවයේ අයිතිවාසිකම් ආරක්‍ෂා කරගැනීම සඳහා ඒ ඒ අධිකරණයන්හි පෙනී සිටීමේ බලය ද බදු ගැනුම්කාර පාර්ශවය වෙත ලබාදී තිබුණි. ඒ අනුව, පවරා දී තිබෙන ඉඩම් සම්බන්ධ නඩු කටයුතුවලදී රජයේ මැදිහත් භාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

(උ) වැවිලි සමාගම් සමඟ වර්ෂ 1995 දී එළඹී ගිවිසුමෙන් පසු 2003 වර්ෂයේදී ඇති කර ගන්නා ලද සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------

විෂය අංක 13501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 99,212 ක ණය මුදල වර්ෂ 21 කට වැඩි කාලයක සිට අය නොවී පැවැතුණි.

(ආ) වැඩ තහනම් කළ හා සේවය අවසන් කර ඇති නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.534,928 ක් වර්ෂ 02 ක් හා වර්ෂ 05 කට වැඩි කාලපරිච්ඡේදයක් මුළුල්ලේ අය නොවී හිඟහිටිව පැවැතුණි.

(ඇ) සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.183,952 ක් වර්ෂ 02 ක් හා 05 කට වැඩි කාලයක සිට අය නොවී හිඟහිටව පැවැතුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

අමාත්‍යාංශය සතු එකතුව රු.9,550,000 ක් වටිනා මෝටර් රථ තුනක් මාස 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**------------------------------------------**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මාස 04 ක පමණ ප්‍රමාදයකින් පසුව 2016 ජූලි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**3.6 කාර්යසාධනය**

**----------------**

වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්ධන වැඩසටහනක් 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණි. මෙම වැඩසටහන සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගය පැවති ප්‍රදේශ සඳහා 2012 වර්ෂයේදී රු. මිලියන 1.11 ක් වැය කර ඉඩම් හිමියන්අතර කුන්දිරා පොල් පැල බෙදා දී තිබුණද, එම පොල් ප්‍රභේදයේ මදය අඩුවීම නිසා හඳුන්වා දීම අසාර්ථක වී තිබුණි.

(ආ) ක්ෂේත්‍ර පරීක්ෂණ ගෘහයක් නඩත්තු කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 33.70 ක ප්‍රතිපාදන සලසා තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමක් මිලදී ගෙන නොතිබුණි.

(ඇ) මෙම වැඩසටහන යටතේ දෙමුහුන් පොල් පැල සමඟ YMP හා ඩොලමයිට් පොහොර කිලෝග්‍රෑම් 01 බැගි න් පොල් වගාකරුවන් වෙත ලබා දීම සඳහා රු.මිලියන 1.58 ක ප්‍රතිපාදන සලසා තිබුණද 2015 වර්ෂය අවසාන වන විටත් එම පොහොර ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව මෙම වැඩසටහන සඳහා රු.මිලියන 100 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් සියයට 51 ක පමණ අඩු මට්ටමක උපයෝජනයක් සිදු කර තිබුණි. රෝග ප්‍රතිරෝධී පොල් පැළ නිපදවීම සඳහා අවශ්‍ය වූ ඉඩම ලබා ගැනීමට නොහැකි වීම නිසා ඒ සඳහා තිබුණු ප්‍රතිපාදනය හා හමුවූ රෝගී ගස් ප්‍රමාණය පහළයෑම හේතුවෙන් වන්දි ගෙවීම ප්‍රමාණය පහළ යාම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව අමාත්‍යාංශය විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ඉ) මෙම ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 394 ක් වැය කර තිබුණද, 2015 වර්ෂය අවසාන වන විටත් එම රෝගය සඳහා ස්ථිර ප්‍රතිකර්මයක් සොයා ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 3.7 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය සතු වාහන 15 කට සිදු වූ අනතුරු නිසා 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 7.84 ක අලාභහානි තවදුරටත් ආවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි. එම අලාභහානි අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී ගබඩාවේ භාණ්ඩ නැතිවීම නිසා සිදු වූ රු.232,500 ක් හා රු.188,900 ක් වටිනා පරිගණක නැතිවීම නිසා සිදුවූ අලාභයන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

## 3.8 අනාර්ථික ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2015 පෙබරවාරි මාසයේදී වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ නිල කාමරය කාපට් කිරීම හා තිරරෙදි දැමීම සඳහා රු.500,055 ක් වැයකර තිබුණු නමුත් එම වර්ෂයේ නව අමාත්‍යවරුන් පත්කිරීමක් සිදු කිරීමෙන් පසු 2015 නොවැම්බර් මාසයේදී පෙර පැවති තිරරෙදි හා කාපට් ඉවත්කර නැවත රු.507,620 ක් වැය කර අළුතින් තිරරෙදි හා කාපට් කිරීම සිදුකර තිබුණි.

(ආ) වර්ග අඩි 16712 ක ප්‍රමාණයක මාසිකව රු.824,567 ක කුලී ගෙවීමක් මත අමාත්‍යාංශය 2015 ජනවාරි මාසය දක්වා ජනවසම ගොඩනැගිලේ ස්ථාපිත කර තිබුණි. 2015 පෙබරවාරි මාසයේ සිට වර්ග අඩි 31,504 ක ප්‍රමාණයක මාසික කුලිය රු.6,830,631 ක් ගෙවා සෙත්සිරිපාය II අදියර ගොඩනැගිල්ලේ මෙම අමාත්‍යාංශය ස්ථාපිත කර තිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

2014 සැප්තැම්බර් 28 දින අනතුරකින් වාහනයකට සිදු වී තිබුණු හානිය රු. මිලියන 3.81 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණු අතර, මෙම වාහනයේ අළුත්වැඩියා කටයුතු 2015 අගෝස්තු 31 දින දක්වා සිදුකර නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අවසන් පරීක්ෂණ වාර්තාව සති 03 ක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස 2014 ඔක්තෝබර් 15 දින අභ්‍යන්තර විගණනට දන්වා තිබුණද එම වාර්තා 2015 දෙසැම්බර් 31 වන විටත් අමාත්‍යාංශයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍ය ව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 24 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 580 | 541 | 39 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 65 | 71 | - | 06 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 01 | 03 | - |
| | එකතුව | 682 | 640 | 48 | 06 |